**ලංසු සඳහා ආරාධනයයි**

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

**<u>ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් කොළඹින් පිටත පිහිටි බඩු ගබඩා ගිවිසුමකට අනුව වසර පහක කාලසීමාවක් සඳහා බදුලබාදීම සඳහා ප්‍රසම්පාදන කමිටු ලංසු කැඳවීමයි</u>**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් කොළඹින් පිටත බඩු ගබඩා වසර 05ක කාලයකට භාණ්ඩ ගබඩා කිරීමට හෝ ව්‍යාපාර කටයුත්තක් සඳහා බදු ලබාදීම පිනිස ලංසු කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසුපත් කැඳවනු ලැබේ.

| අනු අංකය | ගබඩාව පිහිටි ප්‍රදේශය | ප්‍රමාණය (වර්ග අඩි) | අනු අංකය | ගබඩාව පිහිටි ප්‍රදේශය | ප්‍රමාණය (වර්ග අඩි) |
|---|---|---|---|---|---|
| 1 | හපුතලේ I | 1260 | 14 | බලපිටිය | 989 |
| 2 | හපුතලේ II | 1100 | 15 | කැකිරාව | 1800 |
| 3 | හපුතලේ III | 700 | 16 | ත්‍රිකුණාමලය | 1800 |
| 4 | හපුතලේ IV | 600 | 17 | මාතර | 2250 |
| 5 | බදුල්ල I | 1850 | 18 | හලාවත | 2592 |
| 6 | බදුල්ල II | 891 | 19 | මාදම්පෙ | 1960 |
| 7 | හාලිඇල | 861 | 20 | මීරිගම | 1711 |
| 8 | උලපනේ | 960 | 21 | ශ්‍රාවස්තිපුර I | 610 |
| 9 | පානදුර | 1765 | 22 | ශ්‍රාවස්තිපුර II | 204 |
| 10 | හිඟුරක්ගොඩ | 1000 | 23 | ශ්‍රාවස්තිපුර III | 204 |
| 11 | අනුරාධපුර I | 1050 | 24 | නාත්තන්ඩිය | 1200 |
| 12 | අනුරාධපුර II | 1740 | 25 | පොලොන්නරුව | 4680 |
| 13 | ගලබඩ | 1800 | | | |

**<u>01.සුදුසුකම්</u>**

දෙපාර්තමේන්තු කොන්දේසි වලට යටත්ව වඩාත් සුදුසු මිලදීමනාකරුට අදාල බඩු ගබඩා බදු ලබාදීමට කටයුතු කරනු ඇත.

**<u>02.ලංසු අයදුම්පත්‍ර ලබාගැනීම</u>**

ප්‍රසම්පාදන ලියවිලි 2025 ජුනි මස 11 වන දින ප.ව.2.00 දක්වා දුම්රිය වෙළඳ හා අලෙවි කාර්යාලයෙන් හෝ බඩු ගබඩාව පිහිටි දුම්රිය ස්ථානයෙන් ලබා ගත හැක. ඒ සඳහා කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මුල්‍ය නිලධාරි වෙත හෝ අදාල දුම්රිය ස්ථානයේ දුම්රිය ස්ථානාධිපති වෙත ආපසු ගෙවනු නොලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු.2,500/- ක මුදලක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත දුම්රිය මූලස්ථානයේ නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) වෙත හෝ අදාල දුම්රිය ස්ථානයේ දුම්රිය ස්ථානාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ලංසු අයදුම්පතෙහි උපලේඛණ 01 හි සඳහන් එක් එක් බඩු ගබඩාව සඳහා වෙනම සලකා ලංසු ඉදිරිපත් කළ යුතු අතර, ලංසු පෝරම ගාස්තුවට අමතරව එම ලේඛණයේ දක්වා ඇති පරිදි ආපසු ගෙවනු ලබන ලංසු බැඳුම්කරයක්ද ගෙවිය යුතුය. එක් ලංසු පෝරමයක් මගින් ලංසු ඉදිරිපත්කල හැක්කේ එක් බඩු ගබඩාවක් සඳහා පමණි.

**<u>03. ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම</u>**

ඉහත 02 යටතේ සඳහන් ආකාරයට ලබාගන්නා ලද ලංසු අයදුම්පත්‍ර මුල් පිටපත හා අනු පිටපත නිසි පරිදි සම්පූර්ණ කර කවර දෙකක බහා මුද්‍රා තැබිය යුතුය. එම කවරවල මුල් පිටපත හා අනු පිටපත ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය. එම කවර දෙක තනිකවරයක බහා වම් පස ඉහළ කෙළවරේ "කොළඹින් පිටත බඩු ගබඩා සඳහා මිල ගණන් කැඳවීම " යනුවෙන් සඳහන් කොට, එම කවරය මුද්‍රා තබා 2025 ජුනි මස 12 වන දින ප.ව 02.00 පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෙළඳ හා අලෙවි කාර්යාලය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10 ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථාන නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) ගේ නිල කාමරයෙහි ටෙන්ඩර්පත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කටයුතු කළ යුතුය. එම වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාදවූ හා නැතිවූ අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**<u>04. ලංසු භාරගැනීම හා විවෘත කිරීම</u>**

2025 ජුනි මස 12 වන දින ප.ව.2.00 ට ඉහත 03 ජේදයේ දක්වා ඇති පරිදි වෙළඳ හා අලෙවි කාර්යාලයේදී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ එක් නියෝජිතයෙකුට සහභාගී වීමට ඉඩදෙනු ලැබේ.

**05.** ලංසුකරුවන්ට ලංසු ඉදිරිපත් කිරීමට පෙර අදාල ගොඩනැගිල්ල පරීක්ෂා කල හැකි අතර ඒ සඳහා අදාල දුම්රිය ස්ථානයේ ස්ථානාධිපති වෙතින් අවසර ලබාගත යුතුය.

**06.** දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**07.** ලංසුකරුවන්ට වැඩි විස්තර අවශ්‍ය නම් දුරකථන අංක :-011-2421281 – (දිගු අංකය -8235) 0114-600944 හරහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වෙළඳ හා අලෙවි කාර්යාලය වෙතින් ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10.